**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
Ministry of Education, Higher Education and Vocational Education - Piriven Education Division
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சகம் - பிரிவேனா கல்விப் பிரிவு

# අන්තර් පාරිවේණික සිසු නිපුණතා ඇගයීම - 2025

## දිස්ත්‍රික් වටය

**සියලු ම හිමිකම් ඇවිරිණි.** **All rights reserved.** **அனைத்து உரிமைகளும் பாதுகாக்கப்பட்டவை.**

| ජ්‍යෙෂ්ඨ | ත්‍රිපිටක ධර්මඥාන | කාලය පැය - 03 යි. |
|---|---|---|

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

**I කොටස**

01. කෙටි පිළිතුරු සපයන්න.

i. **බ්‍රහ්මජාල සූත්‍රයේ** විස්තරවන සියලු දෘෂ්ටිවාද මූලික වශයෙන් කොටස් කර ඇති **කප්ප** දෙක නම් කර, අර්ථය ද ලියන්න.

ii. **කිටාගිරි** සූත්‍රයේ සඳහන් පුද්ගලයන් **හතකි.** ඉන් **හතර** දෙනෙක් කම් කරන්න.

iii. **ෂට්ශාස්තෲවරු** අතුරින් **හතර දෙනෙක්,** ඔවුන් විසින් ඉදිරිපත් කළ වාද **සමඟ** නම් කරන්න.

iv. චුල්ලවග්ග පාලියට අයත් ඛන්ධක දහයෙන් **හතරක්** නම් කරන්න.

v. **මහාවග්ගපාළියේ** ඇති කථා වස්තු අටක් නම් කරන්න.

vi. බුදු දහමේ ඉගැන්වෙන **මරණයේ ආකාර සතර නම්** කරන්න.

vii. සත්තවිසුද්ධියෙන් **හතරක්** නම් කරන්න.

viii. රූප විභාගයේ එන ලක්ඛණ රූප **හතර** නම් කරන්න.

ix. රූප පරමාර්ථයේ ඉගැන්වෙන උතුජ කලාප **හතර** නම් කරන්න.

x. **අෂ්ටවිද්‍යා** අතුරින් **හතරක්** නම් කරන්න.

**(ලකුණු 4×10 = 40)**

## II - කොටස

02.

i. පටිච්ච සමුප්පාදයේ මූලික සිද්ධාන්තය ලියන්න.

ii. ආර්යමාර්ගය මධ්‍යම ප්‍රතිපදාවක් වන ආකාරය පැහැදිලි කරන්න.

**(ලකුණු 5+7 = 12)**

03.

i. සංවර්ධනය නොවූ චෙතෝවිමුක්තිය වර්ධනය කර ගැනීමට ඉවහල් වන කරුණු පැහැදිලි කරන්න.

ii. බුදු දහම ආත්මවාදයක් නොවන බව පැහැදිලි කරන්න.

**(ලකුණු 5+7 = 12)**

04.

i. ස්පර්ශය(ඵස්ස) කුමක්දැයි එහි ලක්ෂණ ඇසුරින් පැහැදිලි කරන්න.

ii. **සබ්බචිත්තසාධාරණ** චෛතසික පිළිබඳ දැනුවත්භාවයෙහි ප්‍රායෝගික උපයෝගීතාව විස්තර කරන්න.

**(ලකුණු 5+7 = 12)**

05.

i. බුද්ධත්වය පිළිබඳ මහායාන සංකල්පය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

**ii.** පුද්ගල මානසික බලය අනුපූර්වවශයෙන් සංවර්ධනය වන ආකරය සාමඤ්ඤඵල සූත්‍රය ඇසුරෙන් විමසන්න.

**(ලකුණු 5+7 = 12)**

06.

i. ඉපයීම හා පරිභෝජනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පැහැදිලි කරන්න.

**ii.** අපරිහානීය ධර්ම රාජ්‍ය පාලනයෙහි ඇති උපයෝගීතාව විමසන්න.

**(ලකුණු 5+7 = 12)**